# අරමුදල් බලමුළුගැන්වීමේ උපායමාර්ග [වර්තමාන COVID 19 සන්දර්භය තුල]

මංගල ප්‍රනාන්දු (PhD)

අගෝ 2021

## පටුන


| | | |
|---|---|---|
| **1.** | සමාලෝචනය: ශ්‍රී ලංකාව වෙත ලබා දෙන සංවර්ධන සහය | 01 |
| **2.** | වෙළෙඳපොළ පරිලෝකනය ප්‍රදායක සාරාංශය | 02 |
| 2.1 | බහු පාර්ශ්වික ප්‍රදායකයන්: එ.ජා.සං. පද්ධතිය | 03 |
| 2.2 | බහු පාර්ශ්වික ප්‍රදායකයන්: එ.ජා.සං. නොවන පද්ධතිය | 04 |
| 2.3 | රටවල්වල පිහිටි විදේශ තානාපති කාර්යාල (ද්වි පාර්ශ්වික නියෝජිතායතන) | 05 |
| 2.4 | ජාත්‍යන්තර ප්‍රදායක නියෝජිතායතනය | 06 |
| 2.5 | දේශීයව ක්‍රියාත්මක වන අරමුදල් සැපයීමේ උපකරණ | 07 |
| 2.6 | ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීම | 08 |
| 2.7 | ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතන | 09 |
| 2.8 | ජාත්‍යන්තර අරමුදල් රැස්කිරීමේ යෝජනා ක්‍රම | 10 |
| 2.9 | ආයතනික සමාජ වගකීම් අරමුදල් | 10 |
| 2.10 | දේශීය අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර | 11 |
| 2.11 | සමාජ මාධ්‍ය හරහා අරමුදල් රැස්කිරීම | 11 |
| | ඇමුණුම | 12 |


## කෙටිනම්

| | |
|---|---|
| DAC | සංවර්ධනය සඳහා සහාය දෙන රටවල් |
| ECT | නැගෙනහිර බහාලුම් පර්යන්තය |
| GoSL | ශ්‍රී ලංකා රජය |
| LMIC | අඩු මධ්‍ය ආදායම් ලබන රටවල් |
| NGOs | රාජ්‍ය නොවන සංවිධාන |
| ODA | නිල සංවර්ධන සහය |
| UMIC | ඉහළ මධ්‍ය ආදායම් ලබන රටවල් |

*වාර්තාව තුළ පවතින කෙටි නම් බොහෝ ගණනක් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානවල සහ අරමුදල් මූලාශ්‍රවල නම් නියෝජනය කරන බැවින් උපදේශකවරයා ඒවා නොසලකා හැර ඇත.*

## වියාචනය (DISCLAIMER)


මෙම වාර්තාව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයේ හවුල්කාර සංවිධාන සඳහා සම්පත් සවලීකරණය පිළිබඳ කෙටි-කාලීන උපදේශන පැවරුමේ කොටසක් ලෙස සකසන ලද්දක් බව කරුණාවෙන් සලකන්න. එබැවින්, මෙහි නියෝජනය වන්නේ රචකයාගේ දැක්ම, තොරතුරු, දත්ත යනාදිය වන අතර වාර්තාවේ අන්තර්ගතය සම්බන්ධව ශ්‍රී ලංකා පවුල් සංවිධාන සංගමයට කිසිදු වගකීමක් නොමැත.

## I. සමාලෝචනය: ශ්‍රී ලංකාව වෙත ලබා දෙන සංවර්ධන සහය

සංවර්ධන සඳහා ලබා දෙන සහය "නිල සංවර්ධන සහය" (ODA) ලෙස හැඳින්වෙන අතර බොහෝ දියුණු රටවල්වල මහජන ආයතන විසින් අඩු දියුණු රටවල ජීවන තත්ත්වයන් නගා සිටුවීම උදෙසා සපයනු ලබන සියලුම අරමුදල් සැපයීම් (එනම් ප්‍රදාන) සහ මූල්‍යකරණය (එනම් ණය) හැඳින්වීමට එම යෙදුම යොදනු ලැබේ[1]. සංවර්ධනය සඳහා ලබාදෙන සහය "ද්වි පාර්ශ්වික" (එනම් ප්‍රදායක රටේ රජය සහ ප්‍රතිලාභ ලබන රටවල් අතර) සහ "බහුපාර්ශ්වික" (එනම් ප්‍රදායක රටේ මහජන ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන අතර) යන ආකාරයන්ගෙන් විය හැකි අතර එමගින් රාජ්‍ය, දේශීය සහ ජාත්‍යන්තර මූල්‍යකරණය (එනම් ජාත්‍යන්තර මූල්‍ය ආයතන හෝ IFI) මෙන්ම පුද්ගලික ආයෝජන, ඩයස්පෝරාවෙන් සහ පදනම් මගින් සිදු කරන ක්‍රියාවන් වෙතින් ලැබෙන මුදල් මාරු කිරීම් ද අදහස් කෙරේ[2]. කෙසේ වෙතත්, මෙම කොටස මගින් සාකච්ඡා කරනුයේ සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික් නොවන ප්‍රදායකයන් පිළිබඳවයි

වගුව මගින් පෙන්වන පරිදි 2016 වසරේ සිට 2019 වසර දක්වා ශ්‍රී ලංකාවට ලැබුණු සංවර්ධන සහාය වාර්ෂිකව ඇ.ඩො මිලියන 750 ක් වෙයි. එහි ඉහළම දායකයා වන්නේ 2017 සිට 2019 දක්වා වාර්ෂිකව ඇ.ඩො මි. 200 ක නිල සංවර්ධන සහායක් ලබා දුන් ජපානය යි. එක්සත් ජනපදය, යුරෝපා සංගමයේ ආයතන[3], සහ ජර්මනිය අනෙක් ප්‍රමුඛ ප්‍රදායකයන් වූ අතර තවත් සංවර්ධන සහායක රටවල් (DAC) ගණනාවක්ද ශ්‍රී ලංකාවට ලැබුණු සංවර්ධන සහයට දායක විය. මෙම රටවල් "සාම්ප්‍රදායික ප්‍රදායකයන්" ලෙස හැඳින්වේ[4]. DAC රටවල් වෙතින් ශ්‍රී ලංකාවට ලැබුණු සංවර්ධන සහාය 2005 වසර (ආසියානු සුනාමි ව්‍යසනය සිදු වූ) සහ 2010-12 වසර (යුධ ගැටුම් අවසානයේදී සහ ගැටුමෙන් පසු නැවත පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ කාලයේදී) තුළ ඉතා ඉහළ අගයක් ගත් අතර 2016=2019 කාලය තුළ එය සාපේක්ෂව මධ්‍යස්ථ ස්වභාවයක් ඉසිළී ය.

| වගුව ODA ලබා දෙන රට අනුව ශ්‍රී ලංකාවට ලැබෙන සංවර්ධන සහාය | | | | |
|---|---|---|---|---|
| **ODA** රට | වසරකට ඇ,ඩො මිලියන | | | |
| | **2016** | **2017** | **2018** | **2019** |
| සමස්ත | 825.224 | 752.554 | 699.376 | 721.341 |
| ජපානය | 188.181 | 226.606 | 203.411 | 224.842 |
| ඇමරිකා එක්සත් ජනපදය | 34.075 | 27.248 | 30.899 | 30.712 |
| යුරෝපා සංගමයේ ආයතන | 31.205 | 36.471 | 25.818 | 14.436 |
| ජර්මනිය | 19.637 | 16.488 | 12.605 | 14.624 |

*මූලාශ්‍රය: OCED (2021)*[5]

**ලොව තුළ සංවර්ධන සහාය ලබා දීමේ නැගී එන ප්‍රවණතා**

කොවිඩ් 19 තත්ත්වය තුළ සංවර්ධන සහාය ලබා දීමේ ලෝක ව්‍යාප්ත සාකච්ඡාව තුළ නැගී එන ප්‍රවණතා අවබෝධ කරගැනීම අපට වැදගත් වේ. ඒවා නම්;

---

[1]ADF (2021) සංවර්ධන ආධාර: *එය කුමක් ද?* [Online] Accessed at https://www.afd.fr/en/development-aid-whats-it-all-about [Accessed on 15/05/2021]

[2] *Ibid*

[3]යුරෝපා ආයතන වන්නේ යුරෝපා කොමිසම (EC) සහ යුරෝපා ආයෝජන බැංකුවයි (EIB)

[4] සාම්ප්‍රදායික ප්‍රදායකයන් සමන්විත වන්නේ බ්‍රෙට්න්වුඩ්ස් ආයතනයේ සමාරම්භකයන් සහ සාමාජිකයන් ය - සාමාන්‍යයෙන් බටහිර (එ.ජ., ජපානය සහ යුරෝපා සංගමය සහිත කඳවුර) සංවර්ධන සහායක රටවලට අයත් වන හා ජාත්‍යන්තර සංවර්ධන බැංකු (IDB) ය.

[5] Ibid

- සෞඛ්‍ය අංශය තුළ, විශේෂයෙන් කොවිඩ්-19 එන්නත් පර්යේෂණ තුළ නැගී එන ප්‍රවණතාවන් දක්නට හැකි ය. එසේම, සමාජ ආරක්ෂාව සහ සාමාන්‍ය හදිසි මානුෂීය ආධාරයෙන් ඔබ්බට ගොස් පුළුල් පරාසයක හදිසි ඉක්මන් අවශ්‍යතා සපුරාලීම කෙරෙහි වැඩි අවධානයක් යොමු වී ඇති බව අපට පෙනේ.[6]
- කෙටි කාලීන මානුෂීය ආධාර, ණය සහන සහ ගෝලීය පොදු භාණ්ඩ වැනි ක්ෂේත්‍රයන් වෙත සංවර්ධන සහය ලබා දෙන රටවල් සිය පවතින ප්‍රදායක කැපවීම් පවත්වාගෙන යන විට, දැනටමත් පවතින ප්‍රවණතාවල වේගවත් වීම නිරීක්ෂණය කළ හැකි ය[7]. එමෙන්ම, වසංගතය ඇති වීමට පෙර ආරම්භ කර තිබුණු දකුණේ සිට දකුණට සහයෝගිතාව, චීන මහජන සමූහාණ්ඩුව, ඉන්දියාව, බ්‍රසීලය සහ දකුණු අප්‍රිකාව වැනි රටවල් සමග වේගවත් වූ අතර කොවිඩ් -19 තත්ත්වය සමග පොදු භාණ්ඩ පරිත්‍යාග කිරීමේ වැදගත් භූමිකාවක් ඔවුන් විසින් දරනු ලැබී ය.
- කොවිඩ් -10 සමග නොපැහැඩිලි ප්‍රවණතාවන් ද ඉස්මතු විය. උදාහරණයක් ලෙස, දියුණු රටවල් දැන් "එන්නත් ජාතිකවාදය"ක් ප්‍රදර්ශනය කරනු ලබන අතර එමගින් ගෝලීය එන්නත්කරණ වැඩසටහන වෙත වඩා අපක්ෂපාතී හෝ සදාචාරාත්මක එළඹුමකට පිවිසීම වලක්වමින් තිබේ[8]. COVAX සහ Gavi නමින් හැඳින්වෙන බහු පාර්ශ්විය ආයතනවල කොවිඩ් 19 එන්නත් යාන්ත්‍රණය මේ වන විට අරමුදල් රහිත තත්ත්වයකට පත්ව ඇති අතර එමගින් ලොව පුරා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර සෞඛ්‍ය අර්බුදයක් ඇතිවෙමින් තිබේ[9].
- ගෝලීය වසංගතය පවතින තත්ත්වයක් තුළ ප්‍රදානයන් වෙතින් ණය වෙත මාරු වීමේ ප්‍රවණතාවක් ද දක්නට ඇත. ණය වශයෙන් ලබා දුන් නිල සංවර්ධන සහය 2010 සහ 2010 අතර 20% සිට 26% දක්වා වැඩි වූ අතර -එය ප්‍රමාණයෙන් 68% ක වැඩි වීමකි- ප්‍රදානයන්aඅ කාරයෙන් ලබා දෙන නිල සංවර්ධන සාය 72% සිට 61% දක්වා අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය ආයතන වඩා වැඩි වැදගත් භූමිකාව දරන බැවින් මෙම ප්‍රවණතාව 2020 තුළ ශක්තිමත් වෙමින් පවතී. 2020 ජනවාරි සිට නොවැම්බර් දක්වා කාලය තුළ ජාත්‍යන්තර මූල්‍ය ආයතන 2019 වසරට වඩා ඇ.ඩො.බිලියන 40 ක් වැඩියෙන් සහන ණය ලබා දී තිබූ අතර එය 198% ක වර්ධනයකි. එබැවින්, ණය ආකාරයෙන් ලබා දෙන සංවර්ධන සහය දැනටමත් ණය බරින් පීඩිත සංවර්ධනය වෙමින් පවතින රටවලට වඩා දැඩි පීඩනයක් ගෙන එනු ඇත.

රටක ආර්ථික වර්ගීකරණය එක් එක් සංවර්ධනය වෙමින් පවතින රටවල් සම්බන්ධ DAC අරමුදල් තීරණ සමඟ බැඳී ඇත. 2009 වසරේදී යුධ ගැටුම් අවසන් වීමත් සමග ලැබූ ස්ථිර ආර්ථික සංවර්ධනය හේතුවෙන් 2019 වසරේදී ශ්‍රී ලංකාව ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක් (UMIC) බවට පත් වූ නමුත්, 2020 වසරේදී ඉතා ඉක්මණින් පහළ මධ්‍යම ආදායම් ලබන රටක් (LMIC) දක්වා පහතට වැටිණි. ඉහළ මධ්‍යම ආදායම් ලබන රටක ඒක පුද්ගල දළ ජාතික ආදායම වන ඇ.ඩො 4,045 සීමාවෙන් පහතට එනම් ඇ,ඩො 4,020 දක්වා පැමිණීම මෙසේ පහත වැටීමට හේතු විය[10]. "ඒක පුද්ගල ආදායම මත විශාල වශයෙන් පදනම් වන ක්‍රමාංකන සහ ප්‍රතිවර්ගීකරණ ප්‍රතිපත්ති රටක සංකීර්ණ සංවර්ධන අභියෝගයන් හෝ එහි අවදානම් පසුබිම්" හඳුනා නොගන්නා අතර, සංවර්ධන සහය පිළිබඳ දෘෂ්ටි කෝණයෙන් බැලූ විට සංවර්ධන සහය සඳහා වන නියමයන් සහ කොන්දේසි (එනම් ප්‍රදාන සඳහා ඉහළ සුදුසුකම් සහ මූල්‍යකරණය/ණය සඳහා විබණ්ඩනය වූ ණය පොළී) අඩු මධ්‍ය ආදායම් ලබන රටවලට සාපේක්ෂ වශයෙන් වාසි සහගත වේ.

සංවර්ධන සහය ලබා දෙන රටවල සමහර සංවර්ධන ආධාර ඔවුන්ගේ ව්‍යාපාර සහ වෙළෙඳ අභිප්‍රායන් සමග දැඩිව බැඳී පවතින බැවින් 2021 වසර තුළ ශ්‍රී ලංකාවේ භූ දේශපාලන සන්දර්භය, ඇ.එ.ජ සහ ජපානය ඇතුළු ප්‍රදායක රටවල් යම් වැදගත්කමක් එක් කරනු ඇත. මෙහිදී ඇ.එ.ජ. හරහා එන ඉන්දියානු බලපෑම ප්‍රධානතම සාධකයක් වෙයි. කොළඹ නගරය බීජිං වෙත ක්‍රමිකව ඇදී යන ප්‍රවණතාව, ඉන්දියාව සහ ඇ.එ.ජ. වෙතින් වැඩි රාජ්‍යතාන්ත්‍රික අවධානයක් ලැබීමට ඉඩ සලසනු ඇත. මෙම ආතතිය කෙරෙහි වන හොඳම උදාහරණයක් වන්නේ නැගෙනහිර බහාලුම් පර්යන්තය (ECT) සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ඉන්දියාව සහ ජපානය අතර ඇ.ඩො මිලියන 500 ක එකඟතාවකට පැමිණීම යි. ශ්‍රී

[6] Brown, S. (2021) The impact of COVID-19 on development assistance, *Canada's Journal of Global Policy Analysis*, Vol 76(1), pp. 42-54

[7] *Ibid*

[8] *Ibid*

[9] *Ibid*

[10] Serajuddin, U. and Hamadesh, N. (2021) *New World Bank country classifications by income level: 2020 – 2021* [Online] Accessed at https://blogs.worldbank.org/opendata/new-world-bank-country-classifications-income-level-2020-2021 [Accessed on 16/05/2021]

ලංකාව තුළ චීන පැවැත්ම සහ වෙළෙඳ කටයුතු වැඩි වීම බටහිරට කිසිදු විටෙක ධනාත්මක සංඥාවක් ජනිත නොකරයි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ අස්ථිර සහගත ආර්ථික ත්ත්ත්වය සහ ණය අර්බුදය හමුවේ, කොවිඩ් 19 පවතින පසුබිමක මානුෂීය, සෞඛ්‍ය සහ සංවර්ධන වියදම් අතර වන පරතරයන් පියවා ගැනීමට සංවර්ධන සහය ලබාදෙන රටවල් සමග එක් වීමට සිදුවෙනු ඇත. විදේශ විනිමය ලැබීමේ මාර්ග බොහොමයක් අන් කවරදාටත් වඩා අඩුව ගොස් පවතින කල්හි ශ්‍රී ලංකාවට, වසංගතය මගින් වඩාත් දරුණු වූ චර්ෂස්ථායී මූල්‍ය අර්බුදය කළමනාකරණය කරගැනීමට ජාත්‍යන්තරය තුලනය කරගැනීමට සිදු වෙනු ඇත[11]

ශ්‍රී ලංකාව සාම්ප්‍රදායික නොවන ප්‍රදායකයන් මත රඳා පැවතීම (උදා. චීනය සහ ඉරානය) ආරම්භ වූයේ 2009-2014 දක්වා කාලය තුළ යි. සම්ප්‍රදායික නොවන ප්‍රදායකයන් වෙතින් වන සංවර්ධන සහය අඩු කොන්දේසි සහ ඉහළ පොළියක් සමග පැමිණි අතර එය දැඩි ණය බරක් ජනිත කළේ ය. සාම්ප්‍රදායික නොවන පරිත්‍යාගශීලීන්ට අමතරව අර්ධ රාජ්‍ය සංවිධාන (එනම් අපනයන ණය නියෝජිත ආයතන) සහ ස්වෛරීත්ව බැඳුම්කර අලෙවිය ද වේ. ප්‍රජාතන්ත්‍රවාදය සහ මානව හිමිකම් පිළිබඳ දිවයිනේ ගමන්මග සම්බන්ධයෙන් බටහිර පරිත්‍යාගශීලීන් සමඟ සම්පූර්ණයෙන්ම සම්බන්ධ වීමට රට දක්වන මැලිකම හේතුවෙන් යම් ජාත්‍යන්තර මූල්‍ය යාන්ත්‍රණයන්ට (එනම් GSP+) ලංකාව අඩුවෙන් පිළිගත හැකි රටක් බවට පත් කළ හැකි ය. කෙසේ වෙතත්, බටහිර ලොව මූල්‍ය ආධාර ප්‍රතික්ෂේප කිරීමෙන් වලක්වාලීමට ශ්‍රී ලංකාවේ වැදගත් භූ-දේශපාලන ස්ථාවරය දායක විය හැකි අතර එය වැඩි වැඩියෙන් වෙළඳ ගනුදෙනු සහ හවුල්කාරිත්වයන් හරහා චීනය සමග ඇති හවුල්කාරිත්වය ශක්තිමත් කර ගැනීමට ද ඉඩ සලසනු ඇත.


## 2. වෙළෙඳපොළ පරිලෝකනය: ප්‍රදායක සාරාංශය

අරමුදල් මූලාශ්‍ර පරිලෝකනය කිරීමේ නියැලීමට පෙර, දැනට සිටින අරමුදල් සපයන්නන් සහ ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා අරමුදල් සපයන වැඩසටහන් වර්ගීකරණය කිරීමට උපදේශකවරයා උත්සාහ කළේ ය. ප්‍රදායකයන් සහ අරමුදල් සපයන වැඩ සටහන්, අරමුදල් ස්වභාවය, අරමුදල් මූලාශ්‍රය, අරමුදල් අවශ්‍යතා සහ අරමුදල් සම්පාදන ක්‍රමවේදයන් මත පදනම්ව සමාන කොටස් වලට වර්ගීකරණය කරන ලදි. ප්‍රදායක කාණ්ඩ ලැයිස්තුව පහත දැක්වේ;

1. බහු පාර්ශ්වික ප්‍රදායක නියෝජිතායතන: එ.ජා.සං. පද්ධතිය
2. බහු පාර්ශ්වික ප්‍රදායක නියෝජිතායතන: එ.ජා.සං. නොවන පද්ධතිය
3. රට තුළ පිහිටි විදේශ තානාපති කාර්යාල
4. ජාත්‍යන්තර ප්‍රදායක නියෝජිතායතන
5. දේශීය අරමුදල් සැපයීමේ ආයතන
6. ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතන
7. ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීම
8. ජාත්‍යන්තර අරමුදල් රැස් කිරීමේ යෝජනා ක්‍රම
9. ආයතනික සමාජ වගකීම් අරමුදල්
10. දේශීය අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර, සහ
11. සමාජ මාධ්‍ය හරහා අරමුදල් රැස්කිරීම

[11] Asia Pacific Foundation of Canada (2021) Sri Lanka facing growing debt crisis amid COVID 19 trade shock [Online] Accessed at https://www.asiapacific.ca/asia-watch/sri-lanka-facing-growing-debt-crisis-amid-covid-19-trade [Accessed on 16/05/2021]

වාර්ෂිකව ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා සපයන අරමුදල් අනුව සෑම කාණ්ඩයකම අරමුදල් සපයන්නන්ගේ වැදගත්කම අවබෝධ කර ගැනීම ද වැදගත් ය. ශ්‍රී ලංකාවේ මෙවැනි අධ්‍යයන කිසි දිනෙක සිදු වී නැති පසුබිමක, උපදේශකවරයා, ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන 300 කට අධික සංඛ්‍යාවකට ප්‍රතිලාභ ලබා දෙන ප්‍රදායක පදනම් අරමුදල් රැස් කිරීම පිළිබඳව වසර 20 ක පළපුරුද්ද මත පිහිටමින් පහත ප්‍රස්තාරය යෝජනා කර ඇත. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා අරමුදල් සැපයීමේ පදනම වෙත එක් එක් ප්‍රදායක කාණ්ඩය දක්වන දායකත්වය මෙම ප්‍රස්තාරය මගින් දැක්වේ. මෙම අංශය තුළ උපදේශකවරයාගේ පෞද්ගලික පළපුරුද්දට අමතරව, ලංකාවේ අරමුදල් සම්පාදකයින්, ප්‍රවීණයන් සහ සංවර්ධන වෘත්තිකයින් සමඟ උපදේශකවරයා පැවැත්වූ විධිමත් හා අවිධිමත් සාකච්ඡා ද මෙම ගණනය කිරීමට ඉවහල් විය.




අරමුදල් සපයන්නන්ගේ කාණ්ඩ සහ වාර්ෂිකව ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන වෙත ලබාදෙන අරමුදල් දායකත්වය.

බහු පාර්ශ්වික ප්‍රදායක ආයතන (එක්සත් ජාතීන්ගේ සහ එක්සත් ජාතීන්ගේ නොවන අරමුදල් සම්පාදක වැඩසටහන්) ශ්‍රී ලංකාවට ලැබෙන අරමුදල්වලින් අර්ධයකට ආසන්න සීමාවක් සනිටුහන් කරන අතර ජාත්‍යන්තර ප්‍රදායක නියෝජිතායතන (18%), රට තුළ ඇති විදේශ තානාපති කාර්යාල (12%) සහ දේශීයව ඇති අරමුදල් සපයන ආයතන (10%) ද වැදගත් භූමිකාවක් දරයි.

## 2.1 බහු පාර්ශ්වික ප්‍රදායකයන්: එ.ජා.සං. පද්ධතිය (MULTI-LATERAL DONORS: UN SYSTEM)

| | |
|---|---|
| විස්තරය | එක්සත් ජාතීන් යනු එක්සත් ජාතීන්ගේ සංවිධාන පද්ධතියේ කොටසක් වන අතර එක්සත් ජාතීන්ගේ සංවිධානයට අමතරව, ස්වාධීන වූ වැඩ ක්ෂේත්‍රයක් (මැන්ඩේටයක්), නායකත්වයක් සහ අයවැයක් සහිත අරමුදල්, වැඩසටහන් සහ විශේෂිත නියෝජිතායතන එයට අයත් වේ. එයට, අරමුදල් සහ වැඩසටහන් (UNDP, UNEP, UNFPA, UN-Habitat, UNICEF, and WFP), එ.ජා සුවිශේෂී නියෝජිතායතන (FAO, ICAO, IFAD, ILO, IOM, ITU, UNESCO, UNIDO, UPU, WTO, WHO, සහ WMO) හා වෙනත් අස්තිත්වයන් සහ සංවිධාන (UNAIDS, UNHCR, UNOCHA, UNIDIR, UNITAR, UNOPS, UNRWA, UNSSC, UNU, UN Women) අයත් වෙයි. මෙම ආයතන වලින් ලැබෙන ඒකාබද්ධ අරමුදල් ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන වෙත ලැබෙන මුළු අරමුදල් වලින් 15% ක් පමණ වේ[12]. |
| අරමුදල් සැපයීමේ අභිප්‍රායන් | එක්සත් ජාතීන්ගේ සංවිධාන විවිධ අරමුණු සඳහා ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන වෙත ආධාර ලබා දෙයි. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ සංවිධානවල ප්‍රධාන අරමුදල් අභිප්‍රායන් වූයේ ප්‍රජාතන්ත්‍රවාදය, මානව හිමිකම්, නාගරීකරණය, සංවර්ධනය, පරිසරය සහ බලශක්තිය වැනි ජාත්‍යන්තර වැදගත්කමක් ඇති දේශීය ගැටලු ය. |
| අරමුදල් සැපයීමේ ක්‍රම | වඩා වැඩියෙන් කැමති අරමුදල් සැපයීමේ ක්‍රමය වන්නේ අයදුම් ඉල්ලීම ය (RFA) කෙසේ වෙතත් එක්සත් ජාතීන්ගේ අරමුදල් සපයන්නන් හදිසි අවස්ථා සහ ආපදා තත්ත්වයන්වලදී RFA ක්‍රමයට පිටින් ද අරමුදල් සපයයි. |

[12] උපදේශකවරයාගේ නිරීක්ෂණය.

පහත දැක්වෙන ලැයිස්තුව මගින්, එක්සත් ජාතීන්ගේ අරමුදල් සපයන්නන් සහ ශ්‍රී ලංකාව කෙරෙහි අරමුදල් අභිප්‍රායන් සහිත වැඩසටහන් පමණක් සලකා බැලෙයි.

| එජා අරමුදල් සපයන්නා/වැඩසටහන | අභිප්‍රාය ක්ෂේත්‍ර (Interest areas) | ශ්‍රී ලංකාව තුළ පවතින | අරමුදල් සපයනු ලබන රා.නො.සං. වර්ගය |
|---|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | තිරසර සංවර්ධනය | එ.ජා. ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙරට කාර්යාල පිහිටා ඇත | ලාබ නොලබන තත්ත්වයේ ඇති ඕනෑම සුදුසු රා.නො.සං. කෙසේ වෙතත්, සාමාන්‍යයෙන් එක්සත් ජාතීන්ගේ පද්ධතිය සමග වැඩ කිරීමට නීත්‍යානුකූල ස්ථාවරයකින් තොර පුණ්‍යායතන සහ පදනම් දිරිමත් නොකෙරේ. |
| UNICEF | දරුවන්, අධ්‍යාපනය සහ ළමා අයිතිවාසිකම් | | |
| ILO | තිරසර සංවර්ධනය, කම්කරු අයිතිවාසිකම් | | |
| UNIFEM | කාන්තාව සහ ආරක්ෂාව | | |
| UNDEF | ප්‍රජාතන්ත්‍රවාදය, යහපාලනය, මානව අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ අයිතිවාසිකම් | | |
| UN Women | ස්ත්‍රීවාදී හිමිකම්. | | |
| UNOCHA | සරණාගත සහ සරණාගත අයිතිවාසිකම් | | |
| IFAD | ජීවනෝපාය සහ කෘෂිකර්මය | | |
| IOM | සංවිධාන, බලහත්කාරී සංක්‍රමණය සහ සංවර්ධනය | | |
| FAO | ආහාර නිෂ්පාදනය, කෘෂිකර්මය සහ කෘෂි තාක්ෂණය | | |
| ශ්‍රී ලංකාවේ වර්තමාන සහ පෙර අරමුදල් ලබාගත් සංවිධානවල නියැදියක් | සැ. යු. වැඩසටහනේදී මේ පිළිබඳව අපි කතා කරමු. | | |

## 2.2 බහු පාර්ශ්වික ප්‍රදායකයන්: එ.ජා.සං. නොවන පද්ධතිය (MULTI-LATERAL DONORS: NON-UN SYSTEM)

| | |
|---|---|
| විස්තරය | එක්සත් ජාතීන්ගේ පද්ධතියට යටත් නොවන බහු පාර්ශ්වික නියෝජිතායතනවලට, ප්‍රදායක රටවල් විසින් රජයේ අරමුදල් යොදවමින් යම් නිශ්චිත ව්‍යාපෘති/වැඩසටහන් ඔවුන් වෙනුවෙන් ලබා දීම පිණිස මෙහෙයවනු ලබන සියලුම අරමුදල් සැපයීමේ යාන්ත්‍රණ ඇතුළත් වේ. එවැනි නියෝජිතායතනවලට උදාහරණ වනුයේ USAID, US රාජ්‍ය දෙපාර්තමේන්තුව, යුරෝපා කොමිසම, AUSAID, DIFD, JICA, KOICA, TIKA, Qatar Aid, NZAID, CIDA, GTZ, NORAD, SDC, DANIDA, Irish Aid, සහ Kuwait Fund වේ. |
| අරමුදල් සැපයීමේ අභිප්‍රායන් | ඉහත සඳහන් කළ ප්‍රදායක නියෝජිතායතන, ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීමට මාර්ග දෙකක් (රජනය සහ සිවිල් සමාජ සංවිධාන) නඩත්තු කරන අතර, ඒවාට සාමාන්‍යයෙන් තම අරමුදල් අභිප්‍රායන් සහ අනාගත රානොසං හවුල්කරුවන් සඳහා මග පෙන්වීමට රටකට නිශ්චිත වන පත්‍රිකාවන්/ආයතනික උපායමාර්ග සැලසුම්කරණයක් ඇත. මෙම නියෝජිතායතන සාමාන්‍ය අරමුදල් අභිප්‍රායන් වන්නේ ආර්ථික සංවර්ධනය, පරිසරය සහ මානව අයිතිවාසිකම් ය. |
| අරමුදල් සැපයීමේ ක්‍රම | රාජ්‍ය නොවන සංවිධානවලට අරමුදල් සැපයීමට ඔවුන් වඩා කැමති ක්‍රමය ඉල්ලුම් අයදුම් ක්‍රමය/අරමුදල් ලබාදීමේ අවස්ථාව දැන්වීම (RFA/ NOFO) වන අතර, සමහර අවස්ථාවලදී |

| | |
|---|---|
| | නිශ්චිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට උපාය මාර්ගික රාජ්‍ය නොවන සංවිධාන වෙත යොමු වෙයි. |

රාජ්‍ය නොවන සංවිධාන වෙත ප්‍රදාන ලබා දීම සඳහා ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන බහු පාර්ශ්වික නියෝජිතායතන පිළිබඳ තොරතුරු කිහිපයක් පහත ලැයිස්තුවේ අඩංගු වේ.

| ප්‍රජා අරමුදල් සපයන්නා/වැඩසටහන | අභිප්‍රාය ක්ෂේත්‍ර (Interest areas) | ශ්‍රී ලංකාව තුළ පවතින | අරමුදල් සපයනු ලබන රා.නො.සං. වර්ගය |
|---|---|---|---|
| USAID | සංවර්ධනය, මානව අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ සර්වග්‍රාහී සමාජය | රටට අදාළ කාර්යාල සාමාන්‍යයෙන් අදාළ රටේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය තුළ හෝ වෙනමම පිහිටයි. එමෙන්ම, සමහර බහු-පාර්ශ්වික නියෝජිතායතන වලට ශ්‍රී ලංකාව තුළ තම රටේ කාර්යාලය නොමැති නමුත් ඒවා ඉන්දියාව හරහා හෝ වෙනත් දකුණු ආසියානු ස්ථාන හරහා ක්‍රියාත්මක වෙයි. (උදා Irish Aid, DANIDA, TIKA, සහ NZAID) | ලාබ නොලබන තත්ත්වයේ ඇති ඕනෑම සුදුසු රා.නො.සං. |
| එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව | එක්සත් ජනපද රජයේ අවශ්‍යතා රාශියක් ක්‍රියාත්මක කිරීම සඳහා කාර්යාංශ ගණනාවක් තිබේ. | | |
| AUSAID | සංවර්ධනය, අධ්‍යාපනය, සංක්‍රමණය, දේශ සීමා හරහා ආරක්ෂාව, මිනිස් අයිතිවාසිකම්. | | |
| DFID | සංවර්ධනය සහ මිනිස් අයිතිවාසිකම් | | |
| CIDA | පරිසරය සහ සංවර්ධනය | | |
| EC | මිනිස් අයිතිවාසිකම් | | |
| JICA | සංවර්ධනය | | |
| KOICA | අධ්‍යාපනය | | |
| TIKA | සංවර්ධනය, කෘෂිකර්මය | | |
| SDC | සංක්‍රමණය සහ මිනිස් අයිතිවාසිකම් | | |
| Qatar Aid | සංවර්ධනය | | |
| ශ්‍රී ලංකාවේ වර්තමාන සහ පෙර අරමුදල් ලබාගත් සංවිධානවල නියැදියක් | සැ. යු. වැඩසටහනේදී මේ පිළිබඳව අපි කතා කරමු. | | |

## 2.3 රටවල්වල පිහිටි විදේශ තානාපති කාර්යාල (ද්වි පාර්ශ්වික නියෝජිතායතන)

| | |
|---|---|
| විස්තරය | ද්වි පාර්ශ්වික වෙළඳ හා සංවර්ධන ගිවිසුම් සාමාන්‍යයෙන් සිදු කරනු ලබන්නේ කොළඹ පිහිටි තානාපති කාර්යාල සහ මහකොමසාරිස් කාර්යාල හරහා ය. මෙම තානාපති කාර්යාල/මහ කොමසාරිස් කාර්යාලවල වගකීමේ කොටසක් නම් පරිත්‍යාගශීලීන්ගේ රටේ උපාය මාර්ගික අවශ්‍යතා පරිදි ව්‍යාපෘති/ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය නොවන සංවිධාන වෙත අරමුදල් යොමු කිරීමයි. ඒවාට උදාහරණ කිහිපයක් වන්නේ එක්සත් ජනපද තානාපති කාර්යාලය, ජපාන තානාපති කාර්යාලය, ජර්මානු තානාපති කාර්යාලය, ස්විස් තානාපති කාර්යාලය, කටාර් තානාපති කාර්යාලය, නෙදර්ලන්ත තානාපති කාර්යාලය, නෝර්වීජියානු තානාපති කාර්යාලය, ඔස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය, කැනඩා මහ කොමසාරිස් කාර්යාලය සහ බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය, |
| අරමුදල් සැපයීමේ අභිප්‍රායන් | ඉහත සඳහන් කළ තානාපති කාර්යාල හෝ ද්විපාර්ශ්වික නියෝජිතායතන, ශ්‍රී ලංකාවේ ව්‍යාපෘතිවලට අරමුදල් සැපයීමට මාර්ග දෙකක් (රජය සහ සිවිල් සමාජ සංවිධාන) නඩත්තු කරන අතර, ඒවාට සාමාන්‍යයෙන් තම අරමුදල් අභිප්‍රායන් සහ අනාගත රානොසං |

| | |
|---|---|
| | හවුල්කරුවන් සඳහා මග පෙන්වීමට රටකට නිශ්චිත වන පත්‍රිකාවන්/ආයතනික උපායමාර්ග සැලසුම්කරණයක් ඇත. මෙම නියෝජිතායතනවල සාමාන්‍ය අරමුදල් අභිප්‍රායන් වන්නේ ආර්ථික සංවර්ධනය, පරිසරය සහ මානව අයිතිවාසිකම් ය. |
| අරමුදල් සැපයීමේ ක්‍රම | බොහෝ විට මෙම තානාපති කාර්යාල/ ද්විපාර්ශ්වික නියෝජිතායතන ශ්‍රී ලංකාව තුළ ඇති රාජ්‍ය නොවන සංවිධාන උපාය මාර්ගිකව තෝරා ඒ වෙත අරමුදල් සපයයි. තානාපති කාර්යාල හෝ ද්විපාර්ශ්වික නියෝජිතායතනවලට, රාජ්‍ය නොවන සංවිධාන තෝරාගැනීමේ ඔවුන්ටම විශේෂිත වූ නිර්ණායක ඇත. වරින් වර ඔවුන් විවෘත සහ පාරදෘශ්‍ය ක්‍රම මත පදනම් අරමුදල් යෝජනා ක්‍රම දියත් කරනු ලබයි. |

පහත ලැයිස්තුවේ කොළඹ පිහිටි තානාපති කාර්යාල පිළිබඳ තොරතුරු කිහිපයක් ඇතුළත් වේ.

| එජා අරමුදල් සපයන්නා/වැඩසටහන | අභිප්‍රාය ක්ෂේත්‍ර (Interest areas) | ශ්‍රී ලංකාව තුළ පවතින | අරමුදල් සපයනු ලබන රා.නො.සං. වර්ගය |
|---|---|---|---|
| එ.ජ. තානාපති කාර්යාලය | ප්‍රජාතන්ත්‍රවාදය, මිනිස් අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම් | මෙම තානාපති කාර්යාල හෝ ද්විපාර්ශ්වික නියෝජිතායතන ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටා ඇත. | ලාභ නොලබන තත්ත්වයේ රාජ්‍ය නොවන සංවිධාන සහ සීමිත නෛතික තත්ත්වය සහිත සිවිල් සමාජ සංවිධාන |
| ජපාන තානාපති කාර්යාලය | යටිතල පහසුකම් සංවර්ධනය | | |
| ජර්මානු තානාපති කාර්යාලය | මිනිස් අයිතිවාසිකම් | | |
| ස්විස් තානාපති කාර්යාලය | මිනිස් අයිතිවාසිකම් සහ සංක්‍රමණය | | |
| කටාර් තානාපති කාර්යාලය | සංවර්ධනය | | |
| නෙදර්ලන්ත තානාපති කාර්යාලය | සංස්කෘතික අයිතිවාසිකම් සහ මිනිස් අයිතිවාසිකම් | | |
| නෝර්වීජියානු තානාපති කාර්යාලය | මිනිස් අයිතිවාසිකම් සහ සංවර්ධනය | | |
| ඕස්ට්‍රේලියානු මහ කොමසාරිස් කාර්යාලය | සංවර්ධනය සහ දේශසීමා අතර ආරක්ෂාව | | |
| කැනේඩියානු මහ කොමසාරිස් කාර්යාලය | සංවර්ධනය, මිනිස් අයිතිවාසිකම්, අධ්‍යාපනය, පරිසර | | |
| බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් කාර්යාලය | මිනිස් අයිතිවාසිකම් | | |
| ශ්‍රී ලංකාවේ වර්තමාන සහ පෙර අරමුදල් ලබාගත් සංවිධානවල නියැදියක් | සැ. යු. වැඩසටහනේදී මේ පිලිබඳව අපි කතා කරමු. | | |

## 2.4 ජාත්‍යන්තර ප්‍රදායක නියෝජිතායතන

| | |
|---|---|
| විස්තරය | ජාත්‍යන්තර ප්‍රදායක නියෝජිතායතනවලට විවිධ වූ අරමුදල් සැපයීමේ විධි නියෝගයන් සහ අභිප්‍රායන් ඇත. ඒවායේ පැවැත්ම, ආරම්භය, අරමුදල් ධාරිතාව, අරමුදල් සැපයීමේ න්‍යාය පත්‍රය සහ අරමුදල් සැපයීමේ ක්‍රමවේද යනාදිය එකිනෙකට වෙනස් වේ. ඒවායින් කිහිපයක් නම් DanchurchAid, Norad, Bread for the world, Open Society Foundation, Diakonia, Norwegian Church Aid, The Lutheran World Federation, Tear Fund UK and NZ, KIOS, GFW, Christian Aid, Bill & Melinda Gates Foundation, Ford Foundation, GIZ, ICCO, HIVOS, NED, Misereor, Concern, International Coalition of Sites of Conscience, CAFOD, Maypole Fund, සහ IRI. |

| | |
|---|---|
| අරමුදල් සැපයීමේ අභිප්‍රායන් | ජාත්‍යන්තර ප්‍රදායක නියෝජිතායතන එක් එක් කාල විරාමයන් තුළ ප්‍රචාරණය කරනු ලබන විනිවිද පෙනෙන සහ විවෘත අරමුදල් සැපයීමේ යෝජනා ක්‍රම පවත්වාගෙන යනු ලබයි. මෙම සංවිධානවල ක්‍රියා පිළිවෙළ (modus operandi) වන්නේ මහජන සහ තරගකාරී ක්‍රියාවලීන් ය. මෙම සංවිධානවල අරමුදල් සැපයීමේ අභිප්‍රායන් එකිනෙකට වෙනස් වෙන අතර ඒවා මිනිස් අයිතිවාසිකම්වල සිට සංවර්ධනය සහ පරිසරය දක්වාත් විහිදේ. |
| අරමුදල් සැපයීමේ ක්‍රම | බොහෝ විට මෙම සංවිධාන දැඩි හා විනිවිද පෙනෙන තෝරා ගැනීමේ නිර්ණායක සහිතව විවෘත හා මහජන අරමුදල් යෝජනා ක්‍රම පවත්වාගෙන යයි. මෙම ජාත්‍යන්තර සංවිධානවලින් කිහිපයක් ප්‍රධාන අරමුදල් සපයන්නන් වන අතර බහුතරයක් ව්‍යාපෘති පදනම් අරමුදල් සපයන්නන් වේ. |

පහත ලැයිස්තුව තුළ ජාත්‍යන්තර ප්‍රදායක සංවිධානවල පැවැත්ම හෝ අභිප්‍රාය පිළිබඳ හරස්කඩක් දැක්වේ.

<table>
<tr><th>එජා අරමුදල් සපයන්නා/වැඩසටහන</th><th>අභිප්‍රාය ක්ෂේත්‍ර (Interest areas)</th><th>ශ්‍රී ලංකාව තුළ පවතින</th><th>අරමුදල් සපයනු ලබන රා.නො.සං. වර්ගය</th></tr>
<tr><td>Diakonia</td><td>ප්‍රජා සංවර්ධනය, මිනිස් අයිත්වාසිකම්, සංස්කෘතික ප්‍රවර්ධනය</td><td rowspan="11">සමහර අරමුදල් සපයන්නන්ට ශ්‍රී ලංකාව තුළ කාර්යාලයක්, අධ්‍යක්ෂවරයෙක් (කේන්ද්‍ර ලක්ෂ්‍යයක්) පවතින අතර අනෙක් ඒවා සාමාන්‍යයෙන් ඉන්දියාවේ හෝ බැංකොක්වල පිහිටි ආසියානු/දකුණු ආසියානු ප්‍රාදේශීය කාර්යාල හරහා ක්‍රියාත්මක වෙයි.</td><td rowspan="11">අරමුදල් සපයන සංවිධානයේ තේරීම් නිර්ණායක අනුව ලාභ නොලබන තත්ත්වයේ රාජ්‍ය නොවන සංවිධාන සහ සීමිත නෛතික තත්ත්වය සහිත සිවිල් සමාජ සංවිධාන</td></tr>
<tr><td>OSF</td><td>මිනිස් අයිතිවාසිකම්මිනිස් අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය</td></tr>
<tr><td>Tear Fund NZ</td><td>ප්‍රජා සංවර්ධනය</td></tr>
<tr><td>IRI</td><td>ප්‍රජාතන්ත්‍රවාදය</td></tr>
<tr><td>KIOS</td><td>කාන්තා සංවර්ධනය</td></tr>
<tr><td>GFW</td><td>කාන්තා සංවර්ධනය</td></tr>
<tr><td>Ford Foundation</td><td>සංවර්ධනය, මිනිස් අයිතිවාසිකම් සහ ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණ</td></tr>
<tr><td>Site of Conscience</td><td>ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණ සහ අධ්‍යාපනය</td></tr>
<tr><td>Misereor</td><td>මිනිස් අයිතිවාසිකම්</td></tr>
<tr><td>Bread for the World</td><td>සංවර්ධනය සහ මිනිස් අයිතිවාසිකම්</td></tr>
<tr><td>GIZ</td><td>සංවර්ධනය</td></tr>
<tr><td>ශ්‍රී ලංකාවේ වර්තමාන සහ පෙර අරමුදල් ලබාගත් සංවිධානවල නියැදියක්</td><td colspan="3">සැ. යු. වැඩසටහනේදී මේ පිළිබඳව අපි කතා කරමු.</td></tr>
</table>

## 2.5 දේශීයව ක්‍රියාත්මක වන අරමුදල් සැපයීමේ උපකරණ

| | |
|---|---|
| විස්තරය | "ප්‍රදාන ලබාදෙන සංවිධාන" ලෙස දේශීයව ක්‍රියාත්මක වන (උදා. NTT) හෝ ජාත්‍යන්තරව ආරම්භ කරන ලද (උදා SCORE) අරමුදල් සපයන ආයතන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අතර ඒවා රාජ්‍ය නොවන සංවිධාන සහ් සිවිල් සමාජ සංවිධාන සඳහා අරමුදල් සපයයි. මෙම ප්‍රදාන යාන්ත්‍රණ ඔවුන්ගේම පරිත්‍යාගවලින් හෝ ... මගින් සහය ලබයි. |
| අරමුදල් සැපයීමේ අභිප්‍රායන් | අරමුදල් සැපයීමේ උපකරණවල අරමුදල් සැපයීමේ අභිප්‍රායන් විශාල වශයෙන් තීරණය කරනු ලබන්නේ පදනම් අරමුදල් සපයන්නන් ය (MSI/IDEA සම්බන්ධයෙන් ගත් කල, එහි |

| | |
|---|---|
| | එකම අරමුදල් සපයන්නා වන USAID අරමුදල් සැපයීමේ අභිප්‍රායන් තීරණය කරයි). නීලන් තිරුචෙල්වන් භාර (NTT) අරමුදලට එයටම වූ අරමුදලක් ඇතත්, ජාත්‍යන්තර ප්‍රදායකයන්ගෙන්ද සහය ලබා ගනී. එබැවින් මෙම දේශීයව ක්‍රියාත්මක වන අරමුදල් සැපයීමේ උපකරණ ඔවුන්ගේ පදනම් ප්‍රදායකයන්ගේ අරමුදල් අභිප්‍රායන් පිළිබිඹු කරයි. |
| අරමුදල් සැපයීමේ ක්‍රම | ජාත්‍යන්තර අරමුදල් සැපයීමේ සංවිධාන මෙන් බොහෝ විට මෙම සංවිධාන දැඩි හා විනිවිද පෙනෙන තෝරා ගැනීමේ නිර්ණායක සහිතව විවෘත හා මහජන අරමුදල් යෝජනා ක්‍රම පවත්වාගෙන යයි. |

පහත ලැයිස්තුවේ කොළඹ පිහිටි තානාපති කාර්යාල පිළිබඳ තොරතුරු  කිහිපයක් ඇතුළත් වේ.

| එජා අරමුදල් සපයන්නා/වැඩසටහන | අභිප්‍රාය ක්ෂේත්‍ර | ශ්‍රී ලංකාව තුළ පවතින | අරමුදල් සපයනු ලබන රා.නො.සං. වර්ගය |
|---|---|---|---|
| MSI/ IDEA | මිනිස් අයිතිවාසිකම්, යහපාලනය | මෙම දේශීය අරමුදල් සැපයීමේ උපකරණවලට අරමුදල් පරිපාලනය සඳහා මානව සහ වෙනත් සම්පත්වලින් සපිරි ඔවුන්ගේම කාර්යාල රට තුළ පිහිටුවා ඇත. | ලාභ නොලබන තත්ත්වයේ රාජ්‍ය නොවන සංවිධාන සහ සීමිත නෛතික තත්ත්වය සහිත සිවිල් සමාජ සංවිධාන |
| Global Communities/ SCORE | ප්‍රජා සංවර්ධනය, මිනිස් අයිතිවාසිකම්, සමාජ ඒකාබද්ධතාව, මනෝ සමාජයීය සංවර්ධනය | | |
| MEND | ප්‍රජාතන්ත්‍රවාදය සහ මාධ්‍ය නිදහස | | |
| USAID CORE Justice | මිනිස් අයිතිවාසිකම්, නීතියේ පාලනය, යුක්තිය | | |
| Neelan Theruchelvam Trust Fund (NTT) | ප්‍රජා සංවර්ධනය, මිනිස් අයිත්වාසිකම්, කාන්තා අයිතිවාසිකම්, සංස්කෘතික අයිතිවාසිකම් | | |
| International Executive Corps Service/ YouLead | ප්‍රජා සංවර්ධනය | | |
| The Asia Foundation | ප්‍රජා සංවර්ධනය | | |
| USAID BIZ+ | ආර්ථික සංවර්ධනය | | |
| USAID Market Oriented Dairy Project | ආර්ථික සංවර්ධනය | | |
| USAID SDGAP | යහ පාලනය, මිනිස් අයිතිවාසිකම් | | |
| ශ්‍රී ලංකාවේ වර්තමාන සහ පෙර අරමුදල් ලබාගත් සංවිධානවල නියැදියක් | සැ. යු. වැඩසටහනේදී මේ පිලිබදව අපි කතා කරමු. | | |

## 2.6 ශ්‍රී ලංකා රජයේ අරමුදල් සැපයීම

රජයේ ආයතන, අධිකාරි සහ ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ තීරණ ගැනීමේ ආයතන වෙතින් රාජ්‍ය නොවන සංවිධාන අරමුදල් ලබා ගනී. රජය විසින් ළමා සංවර්ධනය, අධ්‍යාපනය, අපද්‍රව්‍ය කළමනාකරණය, ප්‍රජා සංවර්ධන/ආදායම් උත්පාදනය, ආපදා කළමනාකරණය සහ ආපදා ප්‍රතිචාර වැනි සමහර තෝරාගත් ක්ෂේත්‍රවල කටයුතු සඳහා, කළින් පරීක්ෂා කරන ලද රාජ්‍ය නොවන සංවිධානවල සහය අපේක්ෂා කර සිටී.

රජයේ අරමුදල් උත්පාදනය කෙරෙන්නේ රජයේ මූලාශ්‍ර හෝ ADB, JICA, KOICA සහ ලෝක බැංකුව වැනි ජාත්‍යන්තරමූලාශ්‍ර වෙතිනි. මෙම ජාත්‍යන්තර මූලාශ්‍ර, යම් නිශ්චිත කාර්යයන් සහ ව්‍යාපෘති සඳහා රජය විසින් නිර්දේශ/අනුමත කරන ලද රාජ්‍ය නොවන සංවිධාන වෙත අරමුදල් සපයනු ලැබේ. උදාහරණයක් ලෙස, JICA ආර්ථික සංවර්ධන හෝ මූල්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද ආදායම් උත්පාදන ව්‍යාපෘතිවලට අරමුදල් සපයන අතර KOICA අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත අධ්‍යාපන ව්‍යාපෘතිවලට සහය දක්වයි.

තවද, පළාත් සභා මට්ටමින් සංවර්ධන ව්‍යාපෘති සඳහා යම් ආකාරයක රාජ්‍ය නොවන සංවිධාන හවුල්කාරිත්වයක් ඇත.

ප්‍රජා මට්ටමේ ව්‍යාපෘති සහ ක්‍රියාකාරකම් සඳහා පළාත් පාලන ආයතන ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධාන සමඟ අත්වැල් බැඳ ගනී. පළාත් පාලන ආයතන දේශීය රාජ්‍ය නොවන සංවිධාන සමග සහයෝගිතාවට එළඹෙන තවත් ක්ෂේත්‍ර වන්නේ ජල කළමනාකරණය, මුල් ළමාවිය සංවර්ධනය, අධ්‍යාපනය, තරුණ සංවර්ධනය යනාදිය යි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ නව පරිපාලන ක්‍රමයත් සමග ශ්‍රී ලංකා රජය රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වයට ඉතා ඉහළ මට්ටමේ අධීක්ෂණ සහ ආවේක්ෂණ ක්‍රම යොදවා ඇත. 2020 වසරේ මුල් භාගයේදී, ශ්‍රී ලංකා රජය, රාජ්‍ය නොවන සංවිධාන සහ විදේශ අරමුදල් සපයන සංවිධාන සමග ස්වාධීන කොන්ත්‍රාත්වලට එළඹීම රජයේ අමාත්‍යාංශ සහ බලාධිකාරවලට තහනම් කළේ ය. කෙසේ වෙතත්, අධ්‍යාපනය, ආර්ථික සංවර්ධනය සහ ළමා අයිතීන් වැනි අපක්ෂපාතී ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවලට වඩා මිනිස් අයිතිවාසිකම්, ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය වැනි ක්ෂේත්‍රවල කටයුතු කරන රාජ්‍ය නොවන සංවිධාන සඳහා වන සිවිල් ඉඩකඩ සීමාව දැඩි රාජ්‍ය අවේක්ෂණය යටතේ අවදානමට ලක්ව තිබේ.

## 2.7 ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතන

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන විසින් විවිධ ව්‍යාපෘති සඳහා අරමුදල් ලබා ගන්නා ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතන විශාල සංඛ්‍යාවක් ඇත. එවැනි ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතනවලින් සමහරක් නම් Bill and Melinda Gates Foundation, Children's Development Trust, Clinton Foundation, the Duke Endowment, Ford Foundation, Staying Alive Foundation of MTV, Friedrich Ebert Stiftung, Greenpeace, Gill Foundation, International Republic Institute, Jesuit Refugee Service, Maybach Foundation, Rotary Foundation, Nippon Foundation, Lions Clubs International, Catholic Relief Services, Wellcome Trust, Open Society Foundations, William and Flora Hewlett Foundation, Children's Investment Fund Foundation, saha Rockefeller Foundation.

අඩු ආදායම්ලාභී රටවල කුඩා, බිම් මට්ටමේ රාජ්‍ය නොවන සංවිධාන සඳහා නව අවස්ථා නිර්මානය කරමින් ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතන තම සාම්ප්‍රදායික වෙළඳපොලවල් වලින් ඔබ්බට ගොස් සංවර්ධනය වෙමින් පවතින රටවල් කරා ප්‍රවේශ වීමත් සමග ජාත්‍යන්තර පදනම් සහ පුණ්‍යායතන අභිලාශයන්, විශ්වාසය අතින් මෙන්ම සංඛ්‍යාත්මකව ද වර්ධනය වී ඇත.

## 2.8 ජාත්‍යන්තර අරමුදල් රැස්කිරීමේ යෝජනා ක්‍රම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධානවලට Globalgiving, GiveAmdor, Givengain, Akshaya Patra, Feed God's Hungry Children, Equality Now, OneDrop, Embrace Relief, Sevenspikersrelief, Direct Relief, සහ Jaas Foundation (සහ තවත් බොහෝ වූ) නව්‍ය අරමුදල් රැස් කිරීමේ යෝජනා

ක්‍රමවලින් අරමුදල් ලබාගත හැකි ය. මේවා ජාත්‍යන්තරව ක්‍රියාත්මක වන අරමුදල් රැස් කිරීමේ යෝජනා ක්‍රම වන අතර ඔවුන්ගේ අරමුදල් අවශ්‍ය කරන ගැටළු සහ ව්‍යාපෘති සඳහා අරමුදල් රැස් කිරීමට ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල්කාරීත්වයන්ට එළඹේ. මෙම ජාත්‍යන්තර අරමුදල් රැස් කිරීමේ යෝජනා ක්‍රම, ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන වෙනුවෙන් නරඹන්නන් සහ ප්‍රදායකයන් වෙත එළඹෙන අතර දේශීය ව්‍යාපෘති සඳහා අරමුදල් රැස් කරයි. සාමාන්‍යයෙන් පුද්ගලයින් සහ සමාගම් වන අපේක්ෂිත ප්‍රදායකයන්ගේ සිත් දිනා ගැනීම සඳහා ආකර්ෂණීය කථා සහ වීඩියෝ උඩුගත කෙරේ. මෙම අරමුදල් රැස් කිරීමේ අවස්ථාවන් බොහෝ විට වෙබ්-පදනම් අරමුදල් රැස් කිරීම් වෙයි.

තනි රාජ්‍ය නොවන සංවිධානවලට ද, අරමුදල් අවශ්‍ය කරන අවස්ථාවන්, ගැටළු හෝ ව්‍යාපෘති සඳහා ඔවුන්ගේම වූ වෙබ් පදනම් (හෝ ඕන්ලයින්) අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර ආරම්භ කළ හැකි ය. උදාහරණයක් ලෙස American Red Cross, Lions Clubs International, World Wildlife Fund සහ PALMERA ඔවුන්ගේම වූ සංවිධානමය අරමුදල් රැස් කිරීමේ වැඩසටහන් දියත් කරයි. බොහෝ ශ්‍රී ලාංකික සංවිධාන ශ්‍රී ලංකාව තුළ හදිසි අවස්ථාවන් ඇති වූ විට සාර්ථකව තම වෙබ් අඩවි පදනම් අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර දියත් කර ඇත. මෙම අරමුදල් රැස් කිරීමේ ක්‍රමය පරිත්‍යාගශීලීන් සහ ප්‍රතිලාභීන් සමඟ සබඳතා වැඩි කරන ඉතා ඵලදායී අරමුදල් රැස් කිරීමේ ක්‍රමවේදයකි.

## 2.9 ආයතනික සමාජ වගකීම් අරමුදල්

ආයතනික සමාජ වගකීම (CSR) යනු ස්වයං-නියාමනය කරන ව්‍යාපාර ආකෘතියක් වන අතර එය සමාජීය වශයෙන් තමාටත් එහි කොටස්කරුවන්ටත් මහජනතාවටත් වන වගකීම ගොඩනගා ගැනීමට ඉවහල් වේ. "ආයතනික පුරවැසිභාවය" ලෙසද හැඳින්වෙන ආයතනික සමාජ වගකීම භාවිතයට නැගීමෙන් සමාගම්වලට ආර්ථික, සමාජීය සහ පාරිසරික ඇතුළු සමාජයේ සෑම අංශයකම කෙබඳු බලපෑමක් සිදු වේද යන්න පිළිබඳව දැනුවත් විය හැකිය.

ශ්‍රී ලංකාව තුළ MAS Holdings, ජෝන් කීල්ස්, ලින්ක් නැචුරල්, ලංකා IOC PLC, ජෙට්වින්ග්, එයිට්කන් ස්පෙන්ස්, යුනයිටඩ් මෝටර්ස්, ඩේවිඩ් පීරිස්, DFCC බැංකුව, වර්චුසා, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, සෙලාන් බැංකුව, AIA, ලංකා බැංකුව, හැටන් නැෂනල් බැංකුව, කොළඹ වරාය නගරය, කොමර්ෂල් බැංකුව සහ නෙස්ලේ ශ්‍රී ලංකා එසේ ආයතනික සමාජ වගකීම් ව්‍යාපෘති සාර්ථකව දියත් කළ සමාගම්වලට උදාහරණ වේ. ප්‍රජා සංවර්ධනය, පරිසරය ප්‍රවර්ධනය සහ අධ්‍යාපනය සහ තවත් බොහෝ අවස්ථා සහ ව්‍යාපෘති සිදු කිරීමේදී ඔවුන් බොහෝ දුරට රාජ්‍ය නොවන සංවිධාන සමග හවුල් වී සිටිති.

## 2.10 දේශීය අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර

රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාකාරකම් සහ ව්‍යාපෘති සඳහා සහාය වීමට දේශීය අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර බොහෝ දුරට ප්‍රජා මට්ටමින් සිදු කෙරේ. ශ්‍රී ලංකාවේ රාජ්‍ය නොවන සංවිධාන විසින් පවත්වනු ලබන ප්‍රජා සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය ස්වේච්ඡා ශ්‍රම සහාය ප්‍රාදේශීය අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර මගින් ලැබේ. "ස්වේච්ඡා ශ්‍රමය" හෝ "ශ්‍රමදාන" ශ්‍රී ලංකාවේ සාමූහික සමාජ සහ සංස්කෘතික ගොඩනැගුමට පදනම් වූ ඓතිහාසික සංකල්පයකි. සර්වෝදය ශ්‍රමදාන සංගමයට (බොහෝ විට සර්වෝදය ලෙස හඳුන්වන) ශ්‍රී ලංකාවේ මෙම වැදගත් වූ සමාජ වියමන ග්‍රහණය කරගැනීමට හැකි වූ අතර ඒ මතින් 1960 ගණන්වලදී ශ්‍රී ලංකාවේ ප්‍රබල සිවිල් සමාජ ව්‍යාපාරයක් බිහි කරනු ලැබුවේ ය.

නවීන අරමුදල් රැස් කිරීමේ ව්‍යාපාර විවිධ ආකෘති ගනී - ගම් මට්ටමේ නාට්‍යවල සිට ජාතික ස්වේච්ඡා ශ්‍රම ව්‍යාපාර (බාලදක්ෂ ව්‍යාපාරය වැනි) දක්වා එය විහිදෙයි  මේවාගෙන් රැස් කරන අරමුදල් එම අදාළ රාජ්‍ය නොවන සංවිධාන විසින් ක්‍රියාත්මක කරන විවිධ ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා යොදා ගනී.

## 2.11 සමාජ මාධ්‍ය හරහා අරමුදල් රැස්කිරීම

සමාජ මාධ්‍ය අරමුදල් රැස් කිරීම "ඩිජිටල් අරමුදල් රැස්කිරීම" ලෙසද හැඳින්වෙන අතර එය ලෝකය පුරා වර්ධනය වෙමින් පවතී. 2020 වසර තුළ ශ්‍රී ලංකාවේ සමාජ මාධ්‍ය භාවිතා කරන්නන් මිලියන 6.4 කට වැඩි ප්‍රමාණයක් සිටින අතර, එනිසා ම සමාජ මාධ්‍ය සහය දක්වන්නන් සහ බලපෑම්කරුවන් සමග සම්බන්ධතා පවත්වාගැනීමට හැකි ප්‍රබල මෙවලමක් බවට පත්ව ඇත. එම සම්බන්ධතාවන් සාර්ථක ලාබ නොලබන අරමුදල් රැස් කිරීමකට මග පාදනු ලබයි.

කොවිඩ් -19 වසංගතය පවතින මේ කාලය තුළ සමාජ මාධ්‍ය වේදිකා හරහා අරමුදල් රැස්කිරීමේ ව්‍යාපාර මඟින් ශ්‍රී ලාංකික රාජ්‍ය නොවන සංවිධාන සඳහා අරමුදල් උත්පාදනය කර ඇත, උදාහරණ ලෙස ශ්‍රී ලංකා රතු කුරුස සමාජය, සර්වෝදය සහ රොටරි සමාජය දැක්විය හැකි ය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ ලාභ නොලබන සංවිධාන සිය අරමුදල් රැස් කිරීමේ ප්‍රයත්නයන් සඳහා සමාජ මාධ්‍ය වේදිකාවන් ප්‍රශස්ත ලෙස භාවිත කිරීමට තවමත් සමත් වී නැත.,

**වාර්තාව අවසන්**

## ඇමිණුම්

### The Development Partners Forum - සංවර්ධන හවුල්කරුවන්ගේ සංසදය

The Development Partners Forum යනු ශ්‍රී ලංකාවේ රාජ්‍ය දූත මණ්ඩල සහ අරමුදල් සපයන ආයතන වලින් සමන්විත සංසදයකි. නිල සංවර්ධන සහය ලබා දෙන රටවල් සමග සම්බන්ධීකරණයෙන් යුතුව කටයුතු කිරීමේ මූලික වගකීම විදේශ ආධාර ලබන්නෙකු ලෙස ශ්‍රී ලංකා රජය සතුවන බව එය විශ්වාස කරයි. කෙසේ වෙතත්, ආධාර වල සාර්ථකතාව ඉහළ නැංවීම සඳහා, සංවර්ධන හවුල් කරුවන් ලෙස හැඳින්වෙන අවිධිමත් තොරතුරු හුවමාරු හා සම්බන්ධීකරණ යාන්ත්‍රණයක් සැකසීමට හා නඩත්තු කිරීමට ශ්‍රී ලංකාවේ සංවර්ධන හවුල් කරුවෝ විශාල සංඛ්‍යාවක් එකතු වී සිටිති. මෙම ක්‍රියාවලියට, ආධාර ඵලදායිතාව පිළිබඳ පැරිස් ප්‍රකාශනය මෙන්ම Accra Agenda for Action සහ බූසාන් සමුළුව තුළ සිදු කරන ලද කැපකිරීම්වල ආභාසය ලැබී ඇති බව සඳහන් කළ යුතු ය.

මෙහි පහත දක්වා ඇති ද්වි පාර්ශ්වික සහ බහු පාර්ශ්වික අරමුදල් සපයන්නන්/ නියෝජිතායතන යන දෙකම තේමාත්මක සහ ආංශික වශයෙන් බොහෝ ක්ෂේත්‍රයන් සඳහා අඛණ්ඩව ශ්‍රී ලංකාවට අරමුදල් සපයති.

BDG වලට අයත්වන්නේ

| BDG | නේවාසික රට |
|---|---|
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන අබුඩාබි අරමුදල | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| කැනේඩියානු ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය | කැනඩාව |
| චීන සංවර්ධන බැංකු සංස්ථාව | චීන මහජන සමූහාණ්ඩුව |
| ඔස්ට්‍රේලියානු රජය | ඔස්ට්‍රේලියාව |
| බෙල්ජියම් රජය | බෙල්ජියම |
| කැනඩා රජය | කැනඩාව |
| ඩෙන්මාර්ක් රජය | ඩෙන්මාර්කය |
| ෆින්ලන්ත රජය | ෆින්ලන්තය |
| ප්‍රංශ රජය | ප්‍රංශය |

| | |
|---|---|
| හංගේරියානු රජය | හංගේරියාව |
| ඉන්දියානු රජය | ඉන්දියාව |
| ඉරාඅ රජය | ඉරානය |
| ඉතාලි රජය | ඉතාලිය |
| ජපාන රජය | ජපානය |
| කුවේට් රජය | කුවේට් |
| නෙදර්ලන්ත රජය | නෙදර්ලන්තය |
| නවසීලන්ත රජය | නවසීලන්තය |
| නෝර්වේ රජය | නෝර්වේ |
| ස්වීඩන් රජය | ස්වීඩනය |
| ස්විට්සර්ලන්ත රජය | ස්විට්සර්ලන්තය |
| කොරියානු ජනරජය | දකුණු කොරියාව |
| ස්විස් කන්ෆෙඩරේෂණය | ස්විට්සර්ලන්තය |
| එක්සත් රාජධානි රජය | එක්සත් රාජධානිය |
| වෙනිසුවේලා රජය | වෙනිසුවේලාව |
| පකිස්ථාන රජය | පකිස්ථානය |
| එක්සත් අරාබි එමීර් රාජ්‍යය | එක්සත් අරාබි එමීර් රාජ්‍යය |
| ජර්මානු ෆෙඩරල් ජනරජයේ රජය | ජර්මනිය |
| චීන මහජන සමූහාණ්ඩුවේ රජය | චීන මහජන සමූහාණ්ඩුව |
| අමෙරිකා එක්සත් ජනපද රජය | ඇමරිකා එක්සත් ජනපදය |
| ජාත්‍යන්තර සංවර්ධන සහ පර්යේෂණ මධ්‍යස්ථානය | කැනඩාව |
| විදේශ සංවර්ධනය සඳහා වන ඉරාක අරමුදල | ඉරාකය |
| ස්පාඤ්ඤ රජය | ස්පාඤ්ඤය |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වන සවුදි අරමුදල | සවුදි අරාබිය |
| ලිබියානු මහජන අරාබි ජමහිරියාව | ලිබියාව |
| පර්යේෂණ සහයෝගිතාව සඳහා වන ස්වීඩන නියෝජිතායතනය | ස්වීඩනය |
| එක්සත් ජනපදයේ බැන්කර්ස් ට්‍රස්ට් සමාගම | ඇමරිකා එක්සත් ජනපදය |
| Banque Francaise du Commerce Ext. COM | ප්‍රංශය |
| Banque Indo_Suez and BFCE | ප්‍රංශය |
| Bear Steans & Company Inc. | ඇමරිකා එක්සත් ජනපදය |
| Citibank International PLC UK | එක්සත් රාජධානිය |
| Citibank, N.A. | ජපානය |
| Consortium of Swiss Banks | ස්විට්සර්ලන්තය |
| HSBC | හොංකොං |
| Lloyds Bank Plc | එක්සත් රාජධානිය |
| Lloyds Merchant Bank Limited | එක්සත් රාජධානිය |
| Manufacturers Hanover Trust Company | ඇමරිකා එක්සත් ජනපදය |
| MeesPierson N.V. | නෙදර්ලන්තය |
| National Bank For Cooperatives (USA) | ඇමරිකා එක්සත් ජනපදය |
| Skandinaviska Enskilda Banker | ස්වීඩනය |
| Solomon Brothers Incorporated Co. | ඇමරිකා එක්සත් ජනපදය |
| Standard Chartered Bank (UK) | එක්සත් රාජධානිය |
| The Riggs National Bank of Washington DC | ඇමරිකා එක්සත් ජනපදය |
| A/S EKSPORTFINANS | නෝර්වේ |
| AB Svensk Export Credit | ස්වීඩනය |
| ABN - AMRO Bank | නෙදර්ලන්තය |
| ABN-AMRO Stockholm Bank | ස්වීඩනය |
| Agence Francaise De Developement | ප්‍රංශය |
| Australian & New Zealand Investment Bank | ඕස්ට්‍රේලියාව |
| Banco Bilbao Vizcaya Argentaria S.A. | ස්පාඤ්ඤය |
| Bank Austria Creditanstalt AG | ඔස්ට්‍රියාව |
| Banque Francaise Du Com.Ext.&other Banks | ප්‍රංශය |
| Banque Indosuez Stockholm Branch | ස්වීඩනය |

| | |
|---|---|
| BNP Paribas | බෙල්ජියම |
| Calyon Credit Agricole CIB | ප්‍රංශය |
| Citibank International Limited Hong Kong | හොංකොං |
| Co-op Centrale Raiffeisen-Boerenleenbank | නෙදර්ලන්තය |
| Credit Agricole Indosuez | ප්‍රංශය |
| Credit Agricole Indosuez Stockholm Branc | ස්වීඩනය |
| Danske Bank A/S | ඩෙන්මාර්කය |
| Deutsche Bank AG | එක්සත් රාජධානිය |
| Export Development Bank of Iran | ඉරානය |
| Export Finance & Insurance Corporation | ඔස්ට්‍රේලියාව |
| Export Import Bank of United States | ඇමරිකා එක්සත් ජනපදය |
| Export Import Bank of Hungary | හංගේරියාව |
| Export Import Bank of India | ඉන්දියාව |
| Export- Import Bank of Malaysia | මැලේසියාව |
| Finnish Export Credit Ltd. | ෆින්ලන්තය |
| Fortis Bank NV/Fortis Banque SA | බෙල්ජියම |
| Government of the Russian Federation | රුසියාව |
| HSBC Bank PLC (UK) | එක්සත් රාජධානිය |
| HSBC Limited (Hongkong) | හොංකොං |
| ING Bank N. V. | නෙදර්ලන්තය |
| Japan Bank For International Cooperation | ජපානය |
| KBC Bank of Belgium | බෙල්ජියම |
| M/S Mechanoexportimport Rumania | රුමේනියාව |
| Natexis Banques Populaires | ප්‍රංශය |
| Nordea Bank Finland PLC | ෆින්ලන්තය |
| Nordea Bank Sweden | ස්වීඩනය |
| Overseas Private Investment Corporation | ඇමරිකා එක්සත් ජනපදය |
| RAIFFEISEN ZENTRAL BANK | ඔස්ට්‍රියාව |
| Societe Generale | ප්‍රංශය |
| Svenska Handelsbanken AB(publ) | ස්වීඩනය |
| The Export-Import Bank of China | චීන මහජන සමූහාණ්ඩුව |
| UniCredit Bank Austria AG | ඔස්ට්‍රියාව |

බහුපාර්ශ්වික ප්‍රදායක කණ්ඩායමට (MDG) අයත් වන්නේ

| MDG | නේවාසික රට |
|---|---|
| ආසියානු සංවර්ධන බැංකුව | අ/නො |
| යුරෝපා ප්‍රජා කොමිසම | අ/නො |
| යුරෝපා ප්‍රජාව | අ/නො |
| යුරෝපා ආයෝජන බැංකුව | අ/නො |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන ඔපෙක් අරමුදල | අ/නො |
| නෝඩික් සංවර්ධන අරමුදල | අ/නො |
| ආහාර සහ කෘෂිකර්ම සංවිධානය | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| නැවත ඉදිකිරීම් සහ සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර බැංකුව | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| කෘෂිකර්ම සංවර්ධන සඳහා වන ජාත්‍යන්තර අරමුදල | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (UNESCO) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදල (UNFPA) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| සරණාගතයන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් කාර්යාලය (UNHCR) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |

| | |
|---|---|
| එක්සත් ජාතීන්ගේ ළමා අරමුදල (UNICEF) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| එක්සත් ජාතීන්ගේ කාර්මික සංවර්ධන සංවිධානය (UNIDO) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| ලෝක ආහාර වැඩසටහන (WFP) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |
| ලෝක සෞඛ්‍ය සංවිධානය (WHO) | එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන |